බැංකු පනත් විධාන 2018 අංක 12 2018 දෙසැම්බර් 28

# බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ වන තෝලන අනුපාතය

2017 දෙසැම්බර් මස බැංකු අධීක්ෂණය සඳහා වන බාසල් කමිටුව මගින් නිකුත් කරන ලද බාසල් III - පශ්චාත් අර්බුද ප්‍රතිසංස්කරණයන්ට අනුකූල වන පරිදි 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ) (1) යන වගන්ති ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව, මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත (මින් අනතුරුව බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ) මෙම නියෝගයන් නිකුත් කරනු ලැබේ.

අවානම් මත පදනම් වූ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා විශ්වාසනීය ව්‍යාතිරේක මිණුම්දණ්ඩලක් ලෙස අවදානම් මත පදනම් නොවූ තෝලන අනුපාතය, සරල හා පාහැදිලි රාමුවක් යටතේ හඳුන්වා දීම මෙම විධානය නිකුත් කිරීමේ අරමුණ වේ. බැංකු අංශය තුළ තෝලන ඒකරාශී වීම පාලනය කිරීම තුළින් සමස්ථ මූල්‍ය ක්ෂේත්‍රය මෙන්ම ආර්ථිකය තුළ ද ගොඩනැගිය හැකි හානිකර අවතෝලන අස්ථාවරත්වයන් වළක්වාලීම සහ අවදානම් මත පදනම් වූ අවශ්‍යතාවයන් ශක්තිමත් කරනු පිණිස අවදානම් මත නොරැඳුණු, සරළ ආධාරකයක් ලෙස මෙය ක්‍රියා කරනු ඇතැ'යි අපේක්ෂා කෙරේ.

1. බලගැන්වීම

1.1 බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති ප්‍රකාරව බැංකු පද්ධතියේ ශක්තිමත්භාවය තහවුරු කිරීම පිණිස සියලුම හෝ ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වෙත එම බැංකු ව්‍යාපාරයේ කිසියම් ව්‍යාපාර කටයුත්තක් පවත්වාගෙන යෑම පිළිබඳව විධාන නිකුත් කිරීමට මුදල් මණ්ඩලය වෙත බලය පැවරී ඇත.

2. අදාළ විෂය පථය

2.1 මෙම විධානය:

(අ) තනි හෝ ඒකාබද්ධ පදනම මත ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සහ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කර හෝ පිහිටුවා ඇති බැංකු ශාඛාවන් වශයෙන් තනිව ක්‍රියාකාරී වන සියලුම බලපත්‍රලාභී බැංකුවලට අදාළ වේ.

3. තෝලන අනුපාතය ගණනය කිරීම

3.1 2019 ජනවාරි 01 වන දින සිට බලපත්‍රලාභී බැංකු සඳහා අවම තෝලන අනුපාතය 3% ක් වේ.

3.2 පහත දැක්වෙන පරිදි තෝලන අනුපාතය ගණනය කළ යුතුය:

$$\text{තෝලන අනුපාතය} = \frac{\text{ප්‍රාග්ධන මිනුම}}{\text{නිරාවරණ මිනුම}}$$

3.3 තෝලන අනුපාතය කාර්තුමය පදනම මත ගණනය කළ යුතුය.

4. ප්‍රාග්ධන මිනුම

4.1 බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතාවයන් යටතේ නිකුත් කළ 2016 බැංකු පනත් විධාන අංක 01 හි දක්වා ඇති පරිදි ගැලපුම් අඩුකිරීම්වලින් අනතුරුව ලැබෙන ප්‍රාග්ධනයේ පළමු ස්ථරය තෝලන අනුපාතය ගණනය කිරීමේදීදී ප්‍රාග්ධන මිනුම ලෙස බලපත්‍රලාභී බැංකු විසින් භාවිත කළ හැකිය.

5. නිරාවරණ මිනුම

5.1 පහත පරිදි නිරාවරණ මිනුම ගණනය කළ හැකිය:

නිරාවරණ මිනුම = ශේෂපත්‍රය තුළ නිරාවරණයන් (ශේෂපත්‍රය මත දක්වා ඇති ව්‍යුත්පන්නයන් සහ ගනුදෙනු නිරාවරණයන් මූල්‍යනය කරන සුරැකුම් හැර) + ව්‍යුත්පන්න නිරාවරණයන් + ගනුදෙනු නිරාවරණයන් මූල්‍යනය කරන සුරැකුම් + ශේෂපත්‍රයෙන් පරිබාහිර නිරාවරණයන්

5.2 නිරාවරණ මිනුම ගණනය කිරීමේදී බලපත්‍රලාභී බැංකු විසින් භෞතික හෝ මූල්‍ය සුරක්ෂිතතා, ඇපකරයන් හෝ අනෙකුත් ණය අවදානම් අවම කිරීමේ උපක්‍රම නොසලකා හැරිය යුතුය.

| | | | |
|---|---|---|---|
| | | 5.3 | අනුකූලතාවය සහතික කරනු වස් වගකීම්වලට සම්බන්ධ ගැලපුම් හැර බාසල් III රාමුවට අනුව පළමු ප්‍රාග්ධන ස්ථරයෙන් (Tier I Capital) අඩු කරන ලද අයිතම සහ අනෙකුත් නියාමන ගැලපුම් නිරාවරණ මිනුමෙන් අඩු කර දැක්විය යුතුය. |
| | | 5.4 | නිරාවරණ මිනුම ගණනය කිරීම සඳහා මගපෙන්වීම, මෙහි අඩංගු 1 වන උපලේඛනයෙහි දක්වා ඇත. |
| 6. | අනුකූලතාවය රැක ගැනීම සඳහා පියවර | 6.1 | බලපත්‍රලාභී බැංකුවක් අවම තෝලන අනුපාතයට අනුකූල නොවන අවස්ථාවකදී, එබඳු බැංකුවක් විසින් නැවත මෙම අනුකූලතාවය ක්‍රියාත්මක කරන තුරු සහ ඒ බවට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් සහතික කරන තුරු, ලාභාංශ ගෙවීමක් හෝ ලාභ සියරට යැවීමක් හෝ බලපත්‍රලාභී බැංකුවේ නියාමන ප්‍රාග්ධන තත්ත්වය පිරිහීමට ලක්වෙන වෙනත් කිසිඳු ක්‍රියාවක් නොකළ යුතුය. |
| 7. | අනාවරණ අවශ්‍යතා | 7.1 | බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතාවයන් යටතේ 2016 නිකුත් කරන ලද බැංකු පනත් විධාන අංක 01 හි නියමිත අනාවරණ අවශ්‍යතාවයන් තෝලන අනුපාතය සඳහා අදාළ වේ. |
| 8. | නියාමන වාර්තාකරණය | 8.1 | සියලුම බලපත්‍රලාභී බැංකු සෑම කාර්තුවකම අවසන් ලිත් දිනය වන විට ඇති තෝලන අනුපාතය අදාළ කාර්තුව අවසන් වී මසක් ඇතුළත BSD-QF-36-LR සහ BSD-QF-36-EM යන වෙබ් වාර්තා මගින් ඉදිරිපත් කළ යුතුය. |

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

මෙම විධානයේ උපලේඛන I https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Banking_Act_Direction_No_12_of_2018.pdf ඔස්සේ ලබාගත හැක.